# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2012
## 2015 මාර්තු - මැයි

## මානවශාස්ත්‍ර පීඨය

## බෞද්ධ සංස්කෘතිය - BUCU E 2025

## බෞද්ධ සමාජ චින්තාව - පුදසිරිත් හා උත්සව

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි** කාලය : පැය 03 යි

---

01. සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් හේතුඵලවාදී පදනමක් මත ඉදිරිපත් කොට ඇති අයුරු මූලාශ්‍රය අනුව පෙන්වා දෙන්න.

02. "පාරභෞතික ප්‍රස්තුත මගින් පුද්ගල පෞරුෂය යටපත් නොකරන බුදුසමය මානව ශක්‍යතාව හා ස්වාමිත්වය අවධාරණය කරයි." මූලාශ්‍රය ඇසුරින් සනාථ කරන්න.

03. ගෘහස්ථ ජීවිතයේ යහපැවැත්ම පිණිස සමාජානුයෝජනය හා අන්තර්පුද්ගල සබඳතාවන්ගේ වැදගත්කම බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් පෙන්වා දෙන්න.

04. පරාභවය පිණිස ඉවහල්වන මානව චර්යාවන් පෙන්වා දී, සමාජ ප්‍රගතිය පිණිස පිළිපැදිය යුතු ප්‍රතිපදාව කවරේදැයි අදාළ මූලාශ්‍රය මගින් පැහැදිලි කරන්න.

05. ධනය ඉපැයීම හා පරිභෝජනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් සමාජ සහජීවනයට ඉවහල්වන ආකාරය මූලික බුද්ධ දේශනා ඇසුරින් පෙන්වා දෙන්න.

06. බෞද්ධ දේශපාලන මූලධර්ම යහපාලනයක් ගොඩනගා ගැනීමෙහි ලා උපයෝගී කොට ගත හැකි අයුරු මූලික සූත්‍ර දේශනා ඇසුරෙන් පැහැදිලි කරන්න.

07. රටක නීතිරීති පිළිබඳ බුදු සමයේ අවධානය කෙබඳුදැයි පරීක්ෂා කොට සාපරාධී මානව චර්යාවන් පාලනයෙහි ලා, දඬුවම මෙන්ම පුනරුත්ථාපනය ද වැදගත්වන අයුරු පරීක්ෂා කරන්න.

08. පුද පූජා හා සිරිත් විරිත් ගිහි බෞද්ධ ප්‍රතිපදාවේ සාරධර්ම සංරක්ෂණයෙහි ලා ඉවහල්වන ආකාරය සාධක මගින් පැහැදිලි කරන්න.

09. බහු ආගමික සමාජයක් තුළ ආගමික සහජීවනයෙන් ජීවත්වීමට බුදුදහමෙන් මෙන්ම බුදු සිරිතෙන් සැපයෙන ආදර්ශය උදාහරණ මගින් විවරණය කරන්න.

10. බෞද්ධ ආගමික විශ්වාස තුළ සිටිමින්ම, විවිධ අභිචාරවිධි පැවැත්වීමෙහිලා ශ්‍රී ලාංකික බෞද්ධයා විසින් ප්‍රකට කරන ලද කුශලතාව උදාහරණ සහිතව ගෙනහැර දක්වන්න.

********************************